# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,802 - 2013 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2013.03.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 410 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 411 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අප්‍රේල් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මාර්තු මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. douments. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 අප්‍රේල් මස 15 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | උඩුනුවර | උඩුනුවර යටිනුවර කොට්ඨාසයේ හියරාපිටිය ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

03-730

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතලේ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 අප්‍රේල් මස 19 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතලේ | මාතලේ | මාතලේ නගර කොට්ඨාසයේ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. |

03-731

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සංරක්ෂණ සහකාර)/සැලසුම් ශිල්පී/පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013

(1) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සංරක්ෂණ සහකාර) සැලසුම් ශිල්පී/පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී තනතුරු සඳහා මෙයින් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙල කොට 2013.04.15 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙනසේ එවිය යුතු ය.

(2) වැටුප් පරිමාණ - III ශ්‍රේණිය (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 යටතේ එම්එන් - 3 - 2006ඒ)
15,005 - 180 x 4 - 240 x 6 - 320 x 11 - 360 x 20 - 27,885
පුහුණු ශ්‍රේණිය - මාසික දීමනාව - රු. 12,920

(3) *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*
III ශ්‍රේණිය :-මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් හිමි ය. පත්කිරීම කරනු ලබන්නේ අවුරුදු තුනක පරිවාස කාලයක් පිටය.

පුහුණු ශ්‍රේණිය.-පුහුණුලාභීන් දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව නිම කිරීමෙන් පසු පැවැත්වෙන විභාගය සමත් වන්නන්ගෙන් ඉහළම ලකුණු ලබාගත් අනුපිළිවෙල මත පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(4) *අවශ්‍ය සුදුසුකම් :*
සෑම ඉල්ලුම්කරුවකුම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) 2013.04.15 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

(ඇ) *අධ්‍යාපන සුදුසුකම් :*
ඉහත සඳහන් සියලු තනතුරුවල III ශ්‍රේණියට සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සියල්ල සපුරා තිබිය යුතු ය.

(i) ඉහත තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් වයස අවුරුදු 18ත් 30ත් අතර ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
(ii) භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය එකවර සමත්වීම; සහ
(iii) ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකක් ද සහිතව අ. පො. ස. (උ. පෙළ) විද්‍යා විෂයයන් 03කින් එකවර සමත්වීම; සහ
(iv) පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය/ලඝුලේඛනය පිළිබඳ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සහතික පත්‍ර පාඨමාලාවක් සමත්ව තිබීම.

(ඈ) III ශ්‍රේණියට අයදුම් කිරීම සඳහා වූ වෘත්තීය සුදුසුකම් :

කාර්මික නිලධාරි (සංරක්ෂණ සහකාර) සහ සැලසුම් ශිල්පී තනතුරුවල III ශ්‍රේණිය සඳහා වෘත්තීය සුදුසුකම්.—

කාර්මික නිලධාරි (සංරක්ෂණ සහකාර) සහ සැලසුම් ශිල්පී තනතුරුවල III ශ්‍රේණිය සඳහා මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාරේ හාඩි ආයතනය/ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය/ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතනය/ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය/ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන විසින් පිරිනමනු ලබන ජාතික වෘත්තීය කුසලතා මට්ටම ( NVQ) 05ට නොඅඩු ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව හෝ ඉංජිනේරු ඩිප්ලෝමාව හෝ එම තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී තනතුර III ශ්‍රේණිය සඳහා වූ වෘත්තීය සුදුසුකම්—

පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී තනතුර III ශ්‍රේණිය සඳහා අයදුම් කරන්නන් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් පිරිනමනු ලබන ඡායාරූපකරණය පිළිබඳ ඩිප්ලෝමාව ලබා තිබිය යුතු ය.

(ඉ) *පුහුණු ශ්‍රේණියට අයදුම් කිරීම සඳහා වූ වෘත්තීය සුදුසුකම් :*

කාර්මික නිලධාරි පුහුණු ශ්‍රේණිය සඳහා වූ වෘත්තීය සුදුසුකම් :—
කාර්මික නිලධාරි සහ සැලසුම් ශිල්පී තනතුරුවල පුහුණු ශ්‍රේණිය සඳහා අයදුම් කරන්නන් රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ඨකියා ක්ෂේත්‍රයට අදාල ජාතික වෘත්තීය කුසලතා මට්ටම (NVQ) 05ට නොඅඩු ජාතික තාක්ෂණ සහතිකය (තුන් අවුරුදු අර්ධ කාලීන පුහුණු පාඨමාලාව) ලබා තිබීම.

සැලසුම් ශිල්පී පුහුණු ශ්‍රේණිය සඳහා වූ වෘත්තීය සුදුසුකම්:—
රජයේ පිළිගත් වෘත්තීය අධ්‍යාපන ආයතනයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබීම.

පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී පුහුණු ශ්‍රේණිය සඳහා වූ වෘත්තීය සුදුසුකම් :—
රජය පිළිගත් වෘත්තීය අධ්‍යාපන ආයතනයකින් පිරිනමනු ලබන ඡායාරූපකරණය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන හෝ දෑ අවුරුදු අර්ධකාලීන වෘත්තීය පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

5. ඉල්ලුම්කරුවන් පහත සඳහන් ලියවිලිවල පිටපත් ස්වකීය ඉල්ලුම්පත්‍ර වලට අමුණා එවිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය;
(ii) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්;
(iii) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික;
(iv) පදිංචිය සනාථ කරන ග්‍රාම නිලධාරි සහතිකය;
(v) වෙනත් වෘත්තීය සහතික;
(vi) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික;
(vii) ජාතික හැඳුනුම්පත.

6. අයදුම්පත් භාර ගැනීම 2013.04.15 වැනි දිනෙන් අවසන් වේ. අයදුම් කරන තනතුරේ නම කවරයේ වම්පස ඉහල කෙලවරේ පැහැදිලිව සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

7. (i) විභාග ගාස්තු රු. 300 කි. එය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් මගින් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් නමට ආදායම් ශීර්ෂ අංක 2003-02-13 ට බැර කල යුතු ය.
   (ii) සියලුම අයදුම්කරුවන් අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති භාෂා මාධ්‍යයෙන්ම සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.
   (iii) අයදුම්පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.
   (iv) විෂයයන් හා විෂයය නිර්දේශය :
   විවෘත තරග විභාගය පහත සඳහන් විෂයයන් පිළිබඳව ලිඛිත ප්‍රශ්නපත්‍රවලින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100% | 40% |
| පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 01 1/2 | 100% | 40% |

*විෂයය නිර්දේශය* :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය (පැය 01) | අපේක්ෂකයාගේ තර්කානුකූලභාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. |
| 2. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) පැය 01 විනාඩි 30 | (අ) සැලසුම් ශිල්පී හා කාර්මික නිලධාරි (සංරක්ෂණ සහකාර) තනතුරු සඳහා—<br>(i) ඓතිහාසික ස්මාරක පිළිබඳ මූලික අවබෝධය;<br>(ii) වාස්තුවිද්‍යා සංරක්ෂණය මූලධර්ම පිළිබඳ සාමාන්‍ය අවබෝධය;<br>(iii) ඇස්තමේන්තු සැලසුම් කිරීම/ ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳ දැනුම;<br>(iv) සැලසුම් ඇඳීම හා උපකරණ පිළිබඳ අවබෝධය/ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ දැනුම.<br>(ආ) ඡායාරූප ශිල්පී තනතුරු සඳහා—<br>(i) මූලික ඡායාරූප උපකරණ පිළිබඳ දැනුම;<br>(ii) ඡායාරූප ගැනීමේ තාක්ෂණ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම;<br>(iii) ඡායාරූපකරණයට අදාල රසායන ද්‍රව්‍ය පිළිබඳ දැනුම;<br>(iv) මුද්‍රණ කඩදාසි වර්ග පිළිබඳ දැනුම;<br>(v) ඡායාරූපකරනය පිළිබඳ මූල ධර්ම |

මෙම තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලැබේ.

8. රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන්වන සියලු කොන්දේසි මේ සඳහා අදාළ වේ. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරවා එවිය යුතු ය.

වැඩි විස්තර අන්තර්ජාලය ඔස්සේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www. Archaeology. gov.lk වෙත පිවිස ලබාගත හැකි ය.

අධ්‍යක්ෂ ජනරාල්,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

### ආදර්ශ අයදුම්පත්‍රය

**ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි/සැලසුම් ශිල්පී/පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013**

☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3 ☐
(අදාළ කොටුව තුළ ලියන්න.)

අයදුම් කරන ශ්‍රේණිය :
III ශ්‍රේණිය - 1
පුහුණු ශ්‍රේණිය - 2 ☐
(අදාළ කොටුව තුළ ලියන්න.)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) *උදා* : PERERA, A. B. C.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :
(අදාළ කොටුව තුළ ලියන්න.) පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 2013.04.15 වැනි දිනට : අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වර්ෂය :

i. විභාග අංකය :—————.

ii. ප්‍රතිඵල :—————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ. පො. ස. (උ.පෙළ) විභාගය සමත් වර්ෂය ඃ

i. විභාග අංකය :—————.

ii. ප්‍රතිඵල :—————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.0 තාක්ෂණ සුදුසුකම් ඃ

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාල සීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |

6.0 පරිගණක හෝ යතුරුලියන හෝ ලඝුලේඛන සුදුසුකම් :—————.

7.0 රාජ්‍ය සේවයේ නියුතු වූවකු නම්,

7.1 දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ලිපිනය :—————.

7.2 දැනට දරන තනතුර :—————.

7.3 සේවා කාලය :—————.

7.4 ස්ථිර වැටුප් හිමි හෝ තාවකාලික ද යන බව :—————.

7.5 රාජ්‍ය සේවයේ යෙදී සිට ඉන් ඉවත්ව ඇත්නම් ඊට හේතු :——————.

8.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

| ඔව් | | නැත | |
|---|---|---|---|

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

i. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :—————.

ii. ලදුපත් අංකය හා දිනය :—————.

iii. ගෙවූ මුදල :—————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

10.0 අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

—————,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

03-623

---

**ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන ඛණ්ඩ 2 නිලධර ගණයේ ගවේෂණ සහකාර/කැණීම් සහකාර/කැණීම් හා කෞතුකාගාර සහකාර/රසායන සංරක්ෂණ සහකාර/රසායනාගාර සහකාර/නඩත්තු සහකාර යන තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණ සහකාර/කැණීම් සහකාර/කැණීම් හා කෞතුකාගාර සහකාර/ රසායන සංරක්ෂණ සහකාර/රසායනාගාර සහකාර/නඩත්තු සහකාර යන තනතුරු සඳහා මෙ මඟින් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. මේ සමග ඇති ආකෘතියට අනුව පිළියෙල කල අයදුම්පතක් 2013.04.15 වැනි දින හෝ එයට පෙර මාවෙත ලැබෙනසේ එවිය යුතුය.

(1) *වැටුප් පරිමාණ.*—III ශ්‍රේණිය (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 යටතේ එම්එන් - 1 - 2006ඒ)
13,120 - 10 x 145 - 11 x170 - 10 x 240 - 10 x 320 - රු. 22,040

(2) සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :
III ශ්‍රේණිය :-මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් හිමිය. පත්කිරීම කරනු ලබන්නේ අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ව වේ.

(3) අවශ්‍ය සුදුසුකම් :
සෑම ඉල්ලුම්කරුවකුම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) 2013.04.15 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(ඇ) අධ්‍යාපන සුදුසුකම් :
ඉහත සඳහන් සියලු තනතුරු වල III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සියල්ල සපුරා තිබිය යුතුය.

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා ගණිතය සමග තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය එකවර සමත්වීම; සහ

(ii) විෂයයන් එකකින්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) අ. පො. ස. (උ.පෙළ) විභාගය සමත්වීම.

(iii) රසායනාගාර සහකාර සහ රසායන සංරක්ෂණ සහකාර යන තනතුරු සඳහා අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයක් ලෙස සමත්වීම

(ඇ) වෘත්තීය සුදුසුකම් :

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ආයතනයකින් මාස 06කට නොඅඩු පරිගණක පාඨමාලාවක් හදාරි තිබීම හෝ පරිගණක මෙහෙයුම් බලපත්‍රය ලබා තිබීම.

4. ඉල්ලුම්කරුවන් පහත සඳහන් ලියවිලි වල පිටපත් ස්වකීය ඉල්ලුම්පත්‍ර වලට අමුණා එවිය යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්
iii. අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
iv. පදිංචිය සනාථ කරන ග්‍රාම නිලධාරි සහතිකය
v. වෙනත් වෘත්තීය සහතික
vi. ජාතික හැඳුනුම්පත

5. අයදුම්පත් භාර ගැනීම 2013.04.15 වැනි දිනෙන් අවසන් වේ. අයදුම්කරන තනතුරේ නම කවරයේ වම්පස ඉහල කෙලවරේ පැහැදිලිව සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

6. (i) විභාග ගාස්තු රු. 300 කි. එය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් මගින් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003-02-13 ආදායම් ශීර්ෂයට බැර කලයුතුය.
(ii) සියළුම අයදුම්කරුවන් අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති භාෂා මාධ්‍යයෙන්ම සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතුය.
(iii) අයදුම්පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.
(iv) විෂයයන් හා විෂයය නිර්දේශය

විවෘත තරග විභාගය පහත සඳහන් විෂයයන් පිළිබඳව ලිඛිත ප්‍රශ්නපත්‍ර වලින් සමන්විත වේ.

විෂයයන්

| *විෂයයන්* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100% | 40% |
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100% | 40% |

විෂයය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | i. අපේක්ෂකයා සතු අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කන හැකියාව හා සාමාන්‍ය බුද්ධිමය ශක්තීන් මැන බැලීම |
| 2. සාමාන්‍ය දැනීම | i. කාලීන සිදුවීම් පිළිබඳ දැනුම |

(v) මෙම තනතුරු වලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් හෝ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලැබේ.

7. රාජ්‍ය සේවයේ තනතුරු වලට පත්කිරීම සම්බන්ධයෙන් වන සියලු කොන්දේසි මේ සඳහා අදාළ වේ. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරවා එවිය යුතුය.

වැඩි විස්තර අන්තර්ජාලය ඔස්සේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www. Archaeology. gov.lk වෙත පිවිස ලබාගත හැකිය.

අධ්‍යක්ෂ ජනරාල්,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

**ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන බණ්ඩ 2 නිලධර ගණයේ ගවේෂණ සහකාර/කැණීම් සහකාර/කැණීම් හා කෞතුකාගාර සහකාර/රසායන සංරක්ෂණ සහකාර/රසායනාගාර සහකාර/නඩත්තු සහකාර යන තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013**

(අයදුම්කරන තනතුර මෙහි සඳහන් කරන්න.)    කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින
භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
(අදාළ කොටුව තුළ ලියන්න.)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : PERERA, A. B. C.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :
(අදාළ කොටුව තුළ ලියන්න.) පුරුෂ - 0 ස්ත්‍රී - 1 ☐

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 2013.04.15 දිනට වයස : අවුරුදු ☐☐☐ මාස ☐☐ දින ☐☐

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වර්ෂය :
i. විභාග අංකය :————.
ii. ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ. පො. ස. (උ.පෙළ) විභාගය සමත් වර්ෂය :
i. විභාග අංකය :————.
ii. ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.0 පරිගණක සුදුසුකම් :————.

6.0 දැනට දරන තනතුර පිළිබඳ විස්තර,
6.1 වර්තමාන සේවා ස්ථානය :————.
6.2 දැනට දරන තනතුර :————.
6.3 තනතුරට පත්වූ දිනය :————.
6.4 සේවයේ ස්ථිර කල දිනය :————.

7.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ නැත ☐

8.0 අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නිතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු /ඇය මා ඉදිරිපිට දී ..................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

————,
සහතික කරන
අයගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

10.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත නම් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ ............... දින සිට ............... තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට විරුද්ධව කිසිදු

චෝදනාවක් නොමැති බවත්, ඔහු විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දිනය :————.

03-622

---

**ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පැවැත්වෙන මැනුම් ක්ෂෙත්‍ර සහායකයින් පුහුණු කිරීම සඳහා වන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 2/3/4 (NVQ Level 2/3/4) මට්ටමේ පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2013**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පැවැත්වෙන මැනුම් ක්ෂෙත්‍ර සහායකයින් පුහුණු කිරීම සඳහා වන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 2/3/4 (NVQ Level 2/3/4) පාඨමාලාව සඳහා පහත සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. අයැදුම්කරුවන් අතුරින් ඔවුන්ගේ සුදුසුකම් හා කුසලතාවයන් සැලකිල්ලට ගෙන මෙම පාඨමාලාව සඳහා අවශ්‍ය ප්‍රමාණයට සිසුන් බඳවා ගනු ලැබේ.

02. මෙම පාඨමාලාව හැදෑරීමට ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවකු/ ඉල්ලුම්කාරියක—

(i) මනා චරිතයකින් යුක්ත විය යුතු ය;

(ii) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය;

(iii) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන අවසන් දිනය වන විට ඇතුළත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතු ය;

(iv) වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතු ය;

(v) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථයන් දෙකක් සහිතව විෂයයන් හයකින් සමත් විය යුතු ය.

03. මෙම දැන්වීමේ දක්වා ඇති "ආදර්ශ අයදුම්පත්‍රයට" අනුව 11.7" x 8.3" (A4) ප්‍රමාණයේ කඩදාසියක අදාළ අයදුම්පත්, අයදුම්කරුවන් විසින්ම සකස් කර ගත යුතු වේ. සෑම අයැදුම්පත්‍රයක්ම, ආදර්ශ අයැදුම්පතෙහි 14 වැනි අංකය යටතේ සඳහන් වන ප්‍රකාශයට රු. 10 ක් වටිනා වලංගු මුද්දරයක් අලවා තමන්ගේ සුපුරුදු අත්සන යොදා අවලංගු කළ යුතු ය. නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2013.04.05 වැනි දිනට හෝ ඊට පෙර සර්වේයර් ජනරාල් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් සර්වේයර් ජනරාල්, සර්වේයර් ජනරාල් කාර්යාලය, තැ. පෙ. 506, කිරුළ පාර, කොළඹ 05 යන ලිපිනයට එවිය යුතු ය.

04. කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන පාඨමාලාවේ නම හා සංකේත අංකය යොදන්න.

05. නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. මෙම පාඨමාලාවේ මුළු කාලය සති 7 කි. එය පහත වගුවේ දක්වා ඇති පරිදි මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ සති 2 ක පූර්ණ කාලීන නේවාසික පාඨමාලාවකින් ද, ක්ෂෙත්‍රයේ සති 4 ක කර්මාන්ත ආශ්‍රිත පාඨමාලාවකින් ද සර්වේයර් ජනරාල් කාර්යාලයේ සති 1 ක පාඨමාලාවකින් ද ලෙස අදියර 3 කින් සමන්විත වේ. දියතලාවේ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ නේවාසික කාලයේ දී වැයවන විදුලිය, ජලය යනාදිය සඳහා වන වියදම් ලෙස එක් අයැදුම්කරුවකුගෙන් රු. 1,000 ක් අයකරනු ලබන අතර පාඨමාලාව සඳහා තෝරාගත් අයැදුම්කරුවන් පාඨමාලාවේ ආරම්භක දිනයේ දී මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වෙත එම මුදල ගෙවා රිසිට් පතක් ලබා ගත යුතු ය. අවසන් සතිය අවසානයේ දී සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී පාඨමාලාව සාර්ථක ලෙස අවසන් කරන ලද සිසුන් සඳහා සහතික පත්‍ර පිරිනැමීමට කටයුතු යොදා ඇත.

| අදියර | කාලය | පැවැත්වෙන ස්ථානය | නවාතැන් | ආහාර පාන |
|---|---|---|---|---|
| 1 | සති 2 | මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය, දියතලාව (පූර්ණකාලීන නේවාසික පාඨමාලාව) | නේවාසික පහසුකම් ලබා දේ. | සපයා ගත යුතු ය |
| 2 | සති 4 | ක්ෂෙත්‍රයේ පිහිටි ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයන්ට අනුබද්ධව ප්‍රායෝගික පුහුණුව | සපයා ගත යුතු ය | සපයා ගත යුතු ය |
| 3 | සති 1 | සර්වේයර් ජනරාල් කාර්යාලය | සපයා ගත යුතු ය | සපයා ගත යුතු ය |

07. මෙම පාඨමාලාව සිංහල/දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

08. සුදුස්සන් තෝරාගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ය.

09. ලිපිලේඛනවල හෝ සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය. තේරීම් පරීක්ෂණයේ දී අවශ්‍ය හා පිළිගත හැකි ලිපිලේඛනවල සත්‍ය පිටපත් ඉදිරිපත් කර යෝග්‍යතාවය ඔප්පු කිරීමට නොහැකි වන අයදුම්කරුවන් නුසුදුස්සන් වනු ඇත.

10. සිය ලිපිලේඛනවල සත්‍යතාවය පිළිබඳව ඉල්ලුම්කරු සම්පූර්ණයෙන්ම වගකිව යුතු ය. වංචනික හෝ වෙනස්කිරීම් සහිත ලිපිලේඛන ඉදිරිපත් කරන හෝ සඳහන් කරුණු සනාථ වන සේ ලිපි ලේඛන ඉදිරිපත් නොකරන ඉල්ලුම්කරුවන්ට විරුද්ධව තදින් ක්‍රියාකරනු ලැබේ.

11. මෙම ගැසට් පත්‍රයෙහි සඳහන් 2013 වර්ෂයෙහි පැවැත්වීමට නියමිත මෙම පාඨමාලාව පැවැත්වීම, එක් පාඨමාලාවක් සඳහා ඇතුළත් කෙරෙන සිසුන් සංඛ්‍යාව හෝ වර්ෂය තුළ දී පැවැත්වෙන පාඨමාලා සංඛ්‍යාව තීරණය කිරීම සර්වේයර් ජනරාල් ගේ අභිමතය පරිදි වේ.

එස්. එම්. ඩබ්. ප්‍රනාන්දු,
සර්වේයර් ජනරාල්.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506,
කිරුළ පාර, කොළඹ 05.
www.survey.gov.lk

*ආදර්ශ අයදුම්පත්‍රය*

*මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පැවැත්වෙන මැනුම් ක්ෂෙත්‍ර සහායකයින් පුහුණු කිරීම සඳහා වන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 2/3/4 (NVQ Level 2/3/4) මට්ටමේ පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත්කර ගැනීමේ අයදුම්පත්‍රය*

**2013 අධ්‍යයන වසර**

01. පාඨමාලාවේ නම :————.

02. පාඨමාලා සංකේත අංකය :————.

03. අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.

04. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

05. ස්ථිර ලිපිනය :————.

06. සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක :————.
ඊ-මේල් :————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. දිස්ත්‍රික්කය :————. ඡන්ද කොට්ඨාසය :————.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.

09. උපන් දිනය :————. 2013.04.05 වැනි දිනට වයස :
අවුරුදු :—. මාස :—. දින :—.

10. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

11. ඇතුළත්වීමේ සුදුසුකම් ඃ ගැසට් නිවේදනයේ දක්වා ඇති පරිදි ඔබ ලබා ඇති සුදුසුකම් :————.

පාඨමාලාවට ඇතුළත්වීමේ සුදුසුකම්/සහතික පිළිබඳ විස්තර :————.

ලබා ඇති NVQ මට්ටම පාඨමාලාව හැදෑරූ අදාළ සේවා කාලය :————.

සහතිකයේ නම, ආයතනයේ නම, පළපුරුද්ද ඇත්නම් ඒ පිළිබඳ විස්තර (කෙටියෙන් අවුරුදු, මාස) :————.

12. අධ්‍යාපන සුදුසුකම් ඃ

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල (දෙවරකට නොවැඩි වාර ගණනක දී)

| # | විභාග අංකය | විභාගයට පෙනී සිටි වර්ෂය | විභාගයට පෙනී සිටි විෂයයන් | ලබාගත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටියේ නම් එම ප්‍රතිඵල ඃ

| # | විභාග අංකය | විභාගයට පෙනී සිටි වර්ෂය | විභාගයට පෙනී සිටි විෂයයන් | ලබාගත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

13. මීට පෙර NVQ පාඨමාලාවක් හදාරා තිබේනම් එම පාඨමාලාවේ විස්තර ඃ

පාඨමාලාවේ අංකය/සංකේතය :————.

NVQ මට්ටම :————.

ආයතනය :————.

14. අයදුම්කරුගේ ප්‍රකාශය ඃ

මවිසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, ඉල්ලුම්කොට ඇති පාඨමාලාවට අවශ්‍ය සුදුසුකම් මා සපුරා ඇති බවත්, මෙයින් සහතික කරමි. තවද මෙම පාඨමාලාව සම්බන්ධව ඇති සියලු නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමට ද, සර්වේයර් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය ලෙස පිළිගැනීමට ද පොරොන්දු වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

(රු. 10ක මුද්දර අලවා ඒ මත අත්සන තබා අවලංගු කරන්න.)

දිනය :————.

03-723